www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාක්ස්වාදය, ඉතිහාසහ සහ සමාජවාදී විඥානය

## *17-19 පරිච්ඡේද*

**Marxism, History & Socialist Consciousness**
**Chapters 17-19**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

*හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශන ආයතනය වන මේරිං බුක්ස් ඩේවිඩ් නෝර්ත් විසින් රචිත* Marxism, History & Socialist Consciousness *(මාක්ස්වාදය, ඉතිහාසය සහ සමාජවාදී විඥානය) නම් වූ නව ග්‍රන්ථයක් පල කර ඇත. එය දැන් අපගේ වෙබ් අඩවිය හරහා කෙලින් ම මිලදී ගත හැකි ය. එය රචනා කරන ලද්දේ එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්යේ පූර්වගාමියා වූ වර්කර්ස් ලීගයේ හිටපු සාමාජිකයන් වන ඇලෙක්ස් ස්ටයිනර් හා ෆ්‍රෑන්ක් බෙනර් විසින් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ වැඩකටයුතු සම්බන්ධයෙන් කරන ලද* Objectivism or Marxism *(වෛෂයිකවාදය ද මාක්ස්වාදය ද) නම් වූ විවේචනයකට පිලිතුරු වසයෙනි.*

*අපි එම ග්‍රන්ථයේ පෙල කොටස් වසයෙන් පල කිරීම ආරම්භ කලෙමු. එහි පෙරවදන දෙසැම්බර් 10 දා පල වූ අතර 1. 2 හා 3 වන පරිච්ඡේද දෙසැම්බර් 11 දා ද 4 සිට 7 දක්වා පරිච්ඡේද දෙසැම්බර් 13 දා ද 8 සිට 10 දක්වා පරිච්ඡේද දෙසැම්බර් 15 දා ද 11 සිට 13 දක්වා පරිච්ඡේද දෙසැම්බර් 17 දා ද 14 සිට 16 දක්වා පරිච්ඡේද දෙසැම්බර් 19 දා ද පල විය. 17 සිට 19 දක්වා පරිච්ඡේද පහත පල වේ. ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශන ආයතනය වන කම්කරු මාවත ප්‍රකාශකයන් විසින් මෙය සිංහල භාෂාවෙන් ග්‍රන්ථයක් ලෙස පල කරනු ලැබ ඇත.*

### 17. බර්න්ස්ටයින්, විද්‍යාව සහ යුතෝපියානුවාදය

ඔබ ඔය තරම්මැ ආස්වාදයක් ලබාගන්නාවූ රීක්ගේ සංකල්ප සමාලෝචනය කිරීමට පෙරාතුව ඔබගේ අලුත්ම ලිපියට හැරීමට මට අවසර.

ඔබගේ ලියවිල්ලේ දී ද, බ්‍රෙනර් සහෝදරය, ඔබ පසුව එවූ ඒකාබද්ධ ලිපියේ ද, ඔබ යලියලිත් කියා පාන්නේ දෙවන ජාත්‍යන්තරය සමයේ යුතෝපියානුවාදය ට දැක්වුනු විරුද්ධත්වය බොහෝදුරට අවස්ථාවාදය වර්ධනය වීමේ විපාකයක් බව ය.

"යුද්ධ-පූර්ව ජාත්‍යන්තරයේ 'විද්‍යාව'" ඔබ ලියන පරිදි, "(නෝර්ත් විශ්වාස කරන පරිද්දෙන්) හුදෙක් න්‍යායේ අනාසක්ත වර්ධනයක් නො වේ; එය 'වෛෂයික තත්වයන් විසින් ඉබේ ම බලාගනු ඇතැ'යි පැහැර හරිනු ලැබූ විප්ලවවාදී වගකීම්වලින් පලායාම සඳහා නොතැනියාවක් (ගැලවීමේ හේතුවක්) ලෙස එන්න එන්නම වැඩි වසයෙන් යොදා ගනු ලැබිනි. යුතෝපියානුවාදය තථ්‍යසම තහංචියක් බවට පත් කිරීමේ අවශ්‍යතාවය පැන නැංගේ එතැනිනි, යුතෝපියානුවාදය තර්ජනයක් වූයේ විද්‍යාවට නො ව මෙම වෛෂයිකවාදයට හෙයිනිඃ කෙසේ වෙතත්, මාක්ස්වාදයේ තථ්‍ය වර්ධනයේ දී විද්‍යාත්මක සමාජවාදය තම යුතෝපියානු පූර්ව ප්‍රාප්තිකයන් අපෝහකව 'අතික්‍රමනය' කිරීමක් වූයේ ය; එහෙයින් යුතෝපියාව සහ විද්‍යාව දරදඬු ද්විභේදයක් නො ව ප්‍රතිපක්ෂයන්ගේ එකමුතුවක් විය. මාක්ස්වාදී ව්‍යාපාරයේ ධර්ම පුස්තකයන් වන *ගෝතා වැඩ පිලිවෙල පිලිබඳ විවේචනය හෝ රාජ්‍යය හා විප්ලවය,* පමනක් නොව පෝල් ලෆාර්ග්ගේ කුඩා මැනිකක් බඳු වූ *'කම්මැලිව සිටීමේ අයිතිය'* නම් කෘතියේ මෙය පැහැදිලිව ම පෙනී යයි."

ව්‍යාජ-අපෝහක ද්වි-භාෂා වාග්-හරඹය[23] මගින් මුක්කු ගසාගත් ප්‍රති-යුතෝපියානුවාදයේ උපත් පිලිබඳ ඉහත විස්තරය සාරභූත වසයෙන් සාවද්‍ය වේ. බර්න්ස්ටයින් යුතෝපියානුවාදයේ සතුරෙක් වූයේ නැත. සමාජවාදී ව්‍යාපාරය සිය පැවැත්ම විද්‍යාව මත පදනම් කර ගත යුතුව ඇතැයි යන අදහසට විරුද්ධවය බර්න්ස්ටයින් තර්ක කලේ. ඔහු මෙසේ ලිවීයඃ " සමාජවාදය ප්‍රායෝගික කම්කරු පන්තික ව්‍යාපාරයක් ලෙස බොහෝ රටවල්වල දී ජයග්‍රහනයන් පිට ජයග්‍රහනයන් අත් කර ගත් නමුත්, එය තමන්ගේ ආස්ථානය ප්‍රගාමීව පැහැදිලි වන ආකාරයට සූත්‍රගත කර ගෙන ඇති නමුත්, විද්‍යාත්මක න්‍යායක් ලෙස ප්‍රමුඛ පරාජයන් මාලාවකට ම පාත්‍ර වූ එය, එහි නියෝජිතයන්ගේ සැක ශංකා සහගත කරච්චලය ද ව්‍යාකූලත්වය ද මැද්දැවේ තම සංකල්පමය සමවාය බව ද ආරක්ෂිත බව ද හංග කර ගත්තේ ය. එහෙයින් සමාජවාදය සහ විද්‍යාව අතර අභ්‍යන්තර සම්බන්ධතාවයක් පවතී ද යන සුජාත ප්‍රශ්නය පැනනගී. විද්‍යාත්මක සමාජවාදයක ශක්‍යතාවය පිලිබඳ මෙම උත්සුකතාවයට මම ඇත්ත වසයෙන් විද්‍යාත්මක සමාජවාදයක් අවශ්‍ය දැයි යන ප්‍රශ්නය ද එකතු කිරීමට කැමැත්තෙමි." ["How is Scientific Socialism Possible,"

in *Selected Writings of Eduard Bernstein, 1900-1921* (New Jersey, 1996), p.94] (එඩුවාර්ඩ් බර්න්ස්ටයින්, තෝරාගත් කෘති. 1900-1921) නිව් ජර්සි. 1996. පිටුව 94)

සමාජවාදී ව්‍යාපාරයක් තුල යුතෝපියානුවාදය සමග සම්බන්ධතා පැවැතිය යුතු යයි විශ්වාස කල බර්න්ස්ටයින් එවන් සම්බන්ධතා ප්‍රතික්ෂේප කිරීම අත්‍යවශ්‍ය නැතැ යි පමනක් නො ව අනුචිත යයි පවා විශ්වාස කලේ ය. "කෙනෙකු එය කිසියම් තත්වයක්, න්‍යායයක් හෝ ව්‍යාපාරයක් යන කොයි ආකාරයකින් නිර්වචනය කල ද සෑම විටම එක්කෝ පරමාදර්ශය ම නියෝජනය කරන නැත හොත් එම පරමාදර්ශය දෙසට වූ ගමන නියෝජනය කරන *පරමාදර්ශවාදී* ගුනයක් විසින් සෑම විටම සමාජවාදය විනිවිදිනු ලැබ තිබුනි. මේ නිසා සමාජවාදය වනාහි ඔබ්බේ - අප ජීවත් වන ග්‍රහ ලෝකයෙන් පිටත නුවූවත් - සහතිකෙන් ම අපට සාධනීය අත්දැකීමක් නැත්තා වූ ඔබ්බක කොටසකි." (එම 95 පිටුව).

"යුතෝපියානුවාදයට එරෙහිව විද්‍යාව පිහිටුවාලීම අන්තයට ම ගෙන ගිය තැනැත්තා බර්න්ස්ටයින්ය" යි ඔබ කරන කියාපෑම නූතන සංශෝධනවාදයේ ප්‍රාරම්භකයා ලියූ දෙයෙහි සරල දුෂ්අර්ථකතනයකි. තමා යුතෝපියානු යන වචනය යොදා ගත්තේ "අයථාර්ථී සිහින සහ මනස් සෘෂ්ටීන්වලට යොදන මෘදු පදයක් ලෙස නො වේ ය"යි ඔහු ඉතා පරෙස්සමින් පැහැදිලි කලේ ය. යුතෝපියානු යන පදය ඒ අර්ථයෙන් පාවිච්චි කිරීම, "නූතන සමාජවාදයේ පෙරගමන්කරුවන් වූ 19 වන සියවසේ ඒ මහා යුතෝපියානු සීන දකින්නන් තුන්දෙනාට කරන්නා වූ අතිමහත් අයුක්තියක් වනු ඇත." (එම 96 පිටුව) යුතෝපියානුවාදය සහ මාක්ස්වාදය ප්‍රතිපක්ෂයන් ලෙස හැඳින්වීමෙන් බොහෝ ඈත්ව, බර්න්ස්ටයින් තර්ක කලේ, "අප මෙම මහා යුතෝපියානුවන් තිදෙනා (ඕවන්, සේන්ට්-සිමොන් සහ ෆූරියර්) ගේ න්‍යායයන් පරීක්ෂනය කොට සංසන්දනය කල හොත් අපට දක්නට ලැබෙන්නේ මාක්ස් විද්‍යානුකූල අංශය වඩා ඉහල මට්ටමකට අවධාරනය කල බව ය. එහෙත් යුතෝපියානු ලේඛනවල වේවා මාක්ස්ගේ ලේඛනවල වේවා මේ කොයි ම එකක වත් විද්‍යාව වනාහි සියල්ලම නො වේ. මානව අධිෂ්ඨානයේ, පරිකල්පනයේ සහ ආනතියේ ක්ෂේත්‍රය වටා වඩා පටු සීමාවන් මාක්ස් විසින් අඳින ලදි. එහෙත් ඔහු එය මුලුමනින්ම මකා දමන්නේ නැත." (එම 97 පිටුව.)

මාක්ස් සහ ඔහුගේ යුතෝපියානු පූර්වගාමිකයන්ගේ වැඩ කටයුතු අතර අගාධය අතිශයීකරනය කලේ යයි බර්න්ස්ටයින් එංගල්ස්ට චෝදනා කලේ ය. " යුතෝපියානුවන් අලුතින් නිර්මානය කිරීමට වඩා, ගවේෂනය අවධාරනය කල නමුත් ඔහු (එංගල්ස්) ඔවුන්ගේ ලේඛන තුල පරිකල්පනයේ භූමිකාව පමන ඉක්මවා අවධාරනය කිරීම මගින් යුතෝපියානුවන් අහිතකර ආලෝකයකින් ඉදිරිපත් කරයි. අනෙක් අතට නූතන සමාජවාදය මොන ම හෝ ආකාර නිමැවුමක් ඇතුලත් කර ගන්නේ නැතැයි ද ඔහු කියයි. මගේ මතය නම් සමාජවාදය කවර කලෙක වත් 'නිමැවුම් හා පරිකල්පනයන්ගෙන් විනිර්මුක්තව' පැවැතී ද පවතින්නේ ද නැති බව ය." (එම 97 පිටුව).

ඉහත ඡේදයන් පැහැදිලි කරන පරිදි තමාගේ සංශෝධනවාදී ව්‍යාපෘතියට ප්‍රධාන අභියෝගය එල්ල වන්නේ යුතෝපියානුවාදයෙන් නො ව සමාජවාදය විද්‍යාව සමග අනන්‍ය කිරීමෙන් යයි බර්න්ස්ටයින් වටහා ගත්තේ ය. ජාත්‍යන්තර කමිටුවේ "වෛෂයිකවාදය" සහ "වර්ජකවාදය"ට පහරදීමේ දී බර්න්ස්ටයින්ගේ ආස්ථානයන් ප්‍රතිරාවය කරන්නේ ඔබ ය. එතකුදු නො ව "සමාජවාදී පරමාදර්ශවාදය" නව සමාජවාදී සංස්කෘතියක ක්‍රියා මාර්ගික පදනම ලෙස පුනර්ජීවනය කරන මෙන් ඔබ පුන පුනා කරන කැඳවුම මෙම මුඛ්‍ය දාර්ශනික ප්‍රයුක්තියේ දී ඔබව මුලුමනින් ම සංශෝධනවාදීන්ගේ කඳවුර තුල තබන්නේ ය. 1860 ගනන්වල ඇරඹී අන්තිමේ දී බර්න්ස්ටයින් සහ ඔහුගේ සහකරුවන්ගේ න්‍යායික දෘෂ්ටිය හැඩ ගැස්වීමේ ලා ප්‍රමුඛ භූමිකාවක් ඉටු කල "පෙරලා කාන්ට් කරා" ව්‍යාපාරය සමාජවාදය සඳහා අරගලය විද්‍යාත්මක සාධනයන් ඉල්ලා සිටින්නේ නැතැ යි යන සංකල්පය දරා සිටියේ ය. මේ අනුව, සුධී පරමාදර්ශයන් සඳහා කැරෙන ආයාචනයකට - කාන්ට්ගේ නිරූපාධික විධානයේ දෙවන සූත්‍රගත කිරීම තුල ප්‍රකාශයට පත් වූ පරිදි (ඔබ, ඔබ ම තුල වේවයි, නැතහොත් වෙන කිසියම් පුද්ගලයෙකු තුල වේවයි, වන මනුෂ්‍යත්වය සම්බන්ධයෙන් ක්‍රියා කල යුත්තේ කිසි විටෙකත් එය හුදු මාධ්‍යයක් ලෙස නො සලකා සෑම කල්හි ම එය අරමුනක් ද ලෙස ගනිමිනි.) - මාක්ස්ගේ ඓතිහාසික නිර්නයවාදයට තරම්මැ මැනැවින් සමාජවාදය සඳහා අරගලයට සේවය කල හැකි වේ. ඇත්ත වසයෙන්ම 19 වන ශතවර්ෂය අග කාර්ල් වොර්ලැන්ඩර් වැනි ශාස්ත්‍රාලගත වාමයන්ගෙන් කොටසක් සමාජවාදී ව්‍යාපාරය තම දාර්ශනික ප්‍රවේනිය කාන්ට්ට සම්බන්ධ කර ගත යුතු යයි තර්ක කලහ. මාක්ස්වාදයේ පාදක ඓතිහාසික සංකල්පයන් පෙරලා දැමීමට ඇති ඔබේ ම නුගත් හදිස්සිය නිසා ඔබ ඔබගේ ම තර්කයන්ගේ න්‍යායික මූලයන් හා ගම්‍යයන් පිලිබඳව සැලකිල්ලක් දක්වන්නේ නැත.

## 18. නව-යුතෝපියානුවාදය සහ සුලු-ධනේශ්වර වමේ දිරිය බිඳීම

නව යුතෝපියානුවාදය ගැන කරන සමර්පනය ම විසින් මවාගනු ලැබූ "සරලව ම පඹයෙක්'' යයි ඔබ කියාපාන්නෙහිය. මෙවන් ප්‍රවනතාවයක් පවත්නා බව ද, එය කිසියම් වර්ගයක සමකාලීන දේශපාලන අශුභවාදයක් නියෝජනය කරන බව ද තහවුරු කිරීම සඳහා මා උපුටා දැක්වූයේ එකම එක පොතකින්, වින්සන්ට් ජියොසෙගාන්ගේ *Utopianism and*

*Marxism* (යුතෝපියානුවාදය හා මාක්ස්වාදය) යන කෘතියෙන්, පමනක් යයි ද ඔබ කියා සිටින්නෙහි ය. ඇත්තටම නම් මම *අවශ්‍ය හා අනවශ්‍ය යුතෝපියාවන්* යන මැයෙන් පල වූ 2000 *සෝෂලිස්ට් රෙජිස්ටර්* නමැති සඟරාවෙන් ද උපුටා දැක්වීමි. කෙසේ වෙතත්, මෙය වනාහි පහසුවෙන් ම හදාගත හැකි වරදකි. මේ දෙවනු කී කෘතියෙන් වඩාත් නිර්ලෝභව, උපුටා දැක්විය යුතුව තිබුනි; දැන් මම එහි පෙරවදනින් උපුටා දක්වමි.

> *සෝෂලිස්ට් රෙජිස්ටර්* සඟරාවේ මෙම වෙලුමේ තේමාව ප්‍රථමයෙන් ම 1995 දී පිලිසිඳගනු ලැබුවේ පහත සඳහන් පොදු ප්‍රශ්නය සිත්හි දරා ගෙන යඃ අප මෙම සහශ්‍රකයේ අවසානය කරා එලඹෙමින් සිටින තතු තුල, 19 වන සියවසේ බටහිර යුරෝපයේ දී සංකල්පනය කර ගනු ලැබුවා වූ ද විසිවන ශතවර්ෂයේ දී විවිධාකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබුවා වූ ද ප්‍රථම මහා සමාජවාදී ව්‍යාපෘතියේ තැන දූන් ගත හැකි වන්නේ කුමකට ද? වාමාංශික බුද්ධිමතුන් කොතරම් විශාල කොටසක වුවත් ඉස්මොල පලා හාරා බැලුව ද මෙම ප්‍රශ්නයට පිලිතුරක් ලබා ගත හැකි යයි මිථ්‍යාවක් අපට තිබුනේ නැත. එහෙත් වමේ සිහිනය සහ අධ්‍යාසය යලි අලුතින් නිර්මානය කරගැනීමට කාලය දැන් එලඹ ඇතැ යි අප සිතූ අතර මෙම අරමුන උදෙසා ප්‍රයෝජනවත් යමක් එකතු කිරීමට *රෙජිස්ටර්* (සඟරාව)ට හැකි යයි ද අපි සිතුවෙමු. යුතෝපියානු චින්තනය යුතෝපියානු වූ පලියට " අවිද්‍යානුකූලය යි" ප්‍රකාශ කරමින්, මූලධර්මාත්මක වසයෙන් සහ දල සටහනක් වසයෙන් පරිකල්පනය කර නො ගෙන වඩාත් හොඳ සමාජයක් සඳහා ස්ථිරසාර අරගලයක් නොකල හැකි යයි යන්න නොතකා හැරියා වූ මාක්ස්වාදී චින්තනයේ එක්තරා උරුමයකින් බිඳී වෙන්වීම අපට අවශ්‍ය විය. කොමියුනිස්ට්වාදයේ බිඳ වැටීම ද, 'තුන්වන මාවතේ' සමාජ ප්‍රජාතන්ත්‍රවාදය විසින් සමාජවාදී ව්‍යාපෘතිය සමග මොන ම අනන්‍යවීමක් වත් ප්‍රතික්ෂේප කිරීම ද ඉදිරියේ, දැන් විශේෂයෙන් ම නව ලිබරල්වාදී පුනස්ථාපනයේ වැඩෙන අර්බුදයේ සන්දර්භය තුල පරිකල්පක චින්තනයට මගක් පමනක් නො ව අවශ්‍යතාවයක් ද පැන නැග තිබුනු බව අපට විශේෂයෙන් හැඟී ගියේ ය.'' (සෆෝල්ක්, 1999) පිටුව vii.

මෙම වෙලුමේ "අශුභවාදය අතිරෝහනයඃ සමාජවාදී පරිකල්පනයේ ප්‍රතිඋද්දීපනය." යන නම් ලද ප්‍රථම ප්‍රතිපදානයේ දී නව යුතෝපියානුවාදය බුද්ධිමතුන්, සමාජවාදීන් සහ හිටපු රැඩිකලුන් අතර පැතිර පවත්නා දිරිසුන් බව තහවුරු කරනු ලැබ තිබේ. 'ලියෝ පැනිච් සහ සෑම් ගින්ඩින් යන දෙදෙනා විසින් ලියන ලද තේමාවන් බොහොමයක් බ්‍රෙනර්ගේ රචනාවේ තිබෙන අතර මෙම පරිච්ඡේදය ඒවා පූර්වාපේක්ෂනය කරයි. ඒවාට අර්නස්ට් බ්ලොක්ගේ - බ්‍රෙනර් සහෝදරය, ඔබ යුතෝපියානුවාදය පිලිබඳ ඔබේ ලේඛනයේ මාතෘකාව ලෙස දක්වා තිබෙන "දෙයක් දැනගැනීම යනු එහි අවසානය දැනගැනීම ය."[24] යන්න උපුටා ගත්තේ ද බ්ලොක්ගෙන් ම ය. - කෘතීන් ආවහනය ද ඇතුලත් ය. ඔබේ ම වැඩ කටයුතු ද පැහැදිලිව ම එම පරිච්ඡේදයේ ආභාසය ලබා තිබේ. සමකාලීන යුතෝපියානුවාදය අශුභවාදයට ප්‍රතිචාරයක් ය යන්න ඔබ විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම තරමක් උසුලුය, ඒ මන්ද යත්, පැනිච් සහ ගින්ඩින් පෙන්වා දෙන පරිදි හරියට ම බ්ලොක්ගේ ප්‍රාරම්භක වැඩ කටයුතු ප්‍රේරනය වූයේ 1930 ගනන්වල ව්‍යසනයන් විසින් ජනනය කෙරුනු අසුභවාදය ප්‍රතිරෝධනය කිරීමට දරන ලද ප්‍රයත්නය විසින් නිසා ය. ඔවුන් සටහන් කරන පරිදි "බ්ලොක්ගේ ප්‍රතිචාරය වූයේ යුතෝපියාව පිලිබඳ අදහස පුනර්ජීවනය කිරීමට තැත් කිරීම ය. සමාජවාදී දේශපාලනය සීමාස්ථ කරන ලද ලෝකයක වුව, තව මත් අඩු වසයෙන් දවල් හීන මගින් හෝ සන්තෝෂය හා සුසංවාදය සඳහා වූ නොනැසිය හැකි මානුෂික ආශාව, ආර්ථික තරගයට, පෞද්ගලික දේපලට සහ නිලධර රාජ්‍යයට එරෙහිව අත නොහැර ම නැගී සිටින්නා වූ වාත්සල්යයක්" අපට තව මත් සොයා ගත හැකි වේ. (එම පිටු 2)

මාක්ස්වාදය පදනම් වී ඇත්තේ කම්කරු පන්තියේ විප්ලවවාදී විභවය පිලිබඳ අයථාර්ථී අතිශයීකෘත ඇගැයීමක් මත ය යන ඔවුන්ගේ විශ්වාසය රහසක් කර නො ගන්නා පැනිච් සහ ගින්ඩින් මෙසේ ලියති, "සමාජවාදීන් පරම්පරා ගනනාවක් ආභාසිත කලා වූ මාක්ස් තුල පැවැති ඓතිහාසික ශුභවාදය සහ යුතෝපියානු සිහිනයේ පරිමාව සහ විෂය පරිමාව ද එය ඉටු කිරීමේ ගෞරවය පැවැරුනු - නැත හොත් බර පැටවුනු - ධනවාද-නිර්මිත උපකතෘකය - එනම්, කම්කරු පන්තිය ද අතර පරතරය පිලිබඳවත් අඩු ඇගැයුමක් පැවැති බව කිව යුතු ය. විප්ලව/ප්‍රතිවර්තනය පිලිබඳ මාක්ස්ගේ පෘථුල ඓතිහාසිකව ආභාසිත දෘෂ්ටිය සහ දේශපාලන අර්ථ ශාස්ත්‍රය පිලිබඳ ඔහුගේ සවිස්තර විචාරය අතර විශ්ලේෂනාත්මක සහ මූලෝපායික හිදැසක් පැවැති බව කිව යුතු ය - කම්කරු පන්තියේ ධාරිතාවන් පිලිබඳ ගැටලු-සහගත බවට මුහුන නොදී එය තරනය කල නොහැකි විය. සමහර පසුකාලීන මාක්ස්වාදීන් මෙයට මුහුන දුන් නමුත්, කවර කලෙක වත් ඔවුන්ට එය ජයගත හැකි වූයේ නැත... සෑම ප්‍රගතිශීලී සමාජ ව්‍යාපාරයක් ම, වහා හෝ කල් පසු වී, ධනවාදය අපගේ ධාරිතාවන් කොර කර දමන්නේ ය, අපගේ සිහින කුරු කර දමන්නේ ය, සහ අපගේ දේශපාලනය ගිලගන්නේ ය යන ගැලවී ගත නො හැකි කාරනයට මුහුන දිය යුතු වේ." (එම පිටුව 5)

ස්ටයිනර් සහ බ්‍රෙනර් සහෝදරවරුනි, ජාත්‍යන්තර කමිටුවට විරුද්ධවීම ද එය විවේචනය කිරීම ද ඔබේ අයිතියයි, ඒත් අප මෝඩයන් ලෙස නො ගනු මැනවි. අපි සුලු-ධනේශ්වර දේශපාලන සහ ශාස්ත්‍රාලයයික කවයන් තුල සංසරනය වෙමින් පවත්නා සාහිත්‍යය ගැන හොඳින් දැනකියාගෙන සිටිමුඃ ඔබ වැඩ කරන මූලාශ්‍ර මොනවා දැයි කියා ද අපට අනන්‍ය කර ගත හැකි ය. එහෙයින් නව යුතෝපියානුවාදය

සහ එය නිෂ්පන්න කර ගනු ලබන අසුභවාදය ඔබගේ දීප්තිමත් සියත් අදහස් ප්‍රතිරෝධනය කිරීම සඳහා අප විසින් මවන ලද "පඹයන් ය" යි කරුනාකර තර්ක නො කරනු මැනවි. ඔබට අප රැවටිය නො හැකි ය; රවටා ගන්නේ ඔබ ම ය.

මගේ ප්‍රථම දේශනයේ දී ජියොසෙගාන්ගේ *යුතෝපියානුවාදය සහ මාක්ස්වාදය* නමැති කෘතිය පිලිබඳව කැරෙන සමර්පනයන්, "ජියොසෙගාන් (සහ එහෙයින් 'නව-යුතෝපියානුවාදය) නාසි වර්ගයේ මිථ්‍යා පුරානයන්ගේ වාම-වර්තනයක් වෙනුවෙන් පෙනී සිටින බව ඔප්පු කිරීමට සන්දර්භයෙන් පිටස්තරව උදුරා ගන්නා ලද උද්ධෘතයන්ගෙන් සැදුනා වූ කෙටේරි - කෙරුවාවක් ය"යි ද, ඔබ කියන්නෙහි ය. තව ද ඔබ කියන්නේ "පොත කියවන ඕනෑ ම අයෙකුට පෙනී යන පරිදි, එය විකාරයක්" බවයි. "නෝර්ත් විසින් උපුටා දක්වන ලද උද්ධෘතයේ දී ජියොසෙගාන් මතු කල කාරනය වූයේ ජනතා සන්තානයට ආයාචනා කිරීමේ දී නාසීන් ජර්මන් වාමාංශයට වඩා ඉහල සඵලත්වයක් අත් කර ගත් බව යැ"යි ද [25] ඔබ කියා සිටී.

එම උද්ධෘත සන්දර්භයෙන් ඉරා වෙන් කරනු නො ලැබූහ. එයට ප්‍රතිකූලව, අප ජියොසෙගාන්ගෙන් වඩාත් පෘථුල උද්ධෘතයන් ඉදිරිපත් කලේ නම්, ඔහුගේ පොත මානව ප්‍රේරනයේ ලා අහේතුවාදී බවේ බලපෑම හා අර්ථභාරය හීන අගැයුමකට ලක් කිරීම පිලිබඳව මාක්ස්වාදයට පහර දෙන කෘතියක් ය යන මගේ අගැයුම තවදුරටත් තහවුරු කෙරෙනු ඇත. ජියොසෙගාන් පිලිබඳව මා කල සමර්පනයේ දී මා ප්‍රකාශ කලේ " මාක්ස් සහ එංගල්ස් මනෝවිද්‍යාවක් වර්ධනය කර ගැනීමට අසමත්වීම" ගැන ඔහු ඔවුන්ව විවේචනය කරන බව ය. "ඔවුන් (මාක්ස් හා එංගල්ස්) මානව ප්‍රේරනයේ සංකීර්නතාවයන් පිලිබඳව ඉතුරු කර තැබුවේ ඉතා හීන දායාදයකි; ඔවුන්ගේ සමීපතම අනුප්‍රාප්තිකයන්ගෙන් වැඩි දෙනා මෙම අඩුව ජය ගැනීම සඳහා එතරම් උනන්දුවක් නො දැක්වූහ."

ඉහත උද්ධෘතය "ඉරාගනු ලැබූ" මුලු ඡේදය ම උපුටා දක්වමින් එහි සන්දර්භය තුල තබා බලමු. ජියොසෙගාන් මෙසේ ලියයිඃ

> "මාක්ස්වාදය තුල හේතුවාදී ප්‍රවනතාවයක් යයි නම් කල හැකි වූ දෙයක් සෑම විට ම පැවැතී ඇත. එය පුද්ගලයා පිලිබඳ බුද්ධි ප්‍රබෝධයට අයත් ආකෘතියක් යොදා ගෙන සිය විග්‍රහය කරයි; එහි ප්‍රමුඛ විභේදය නම් දැනුම හා නො දැනුම අතර ය. මෙය ධනවාදයේ කේන්ද්‍රීය පරස්වාචකයට යතුර සපයයි; එනම්ඃ මිනිස්සු තමන්ගේ ම අවශ්‍යතාවලට එරෙහි වූ තත්වයන් දරා ගෙන සිටිති. ව්‍යාජ විඥානය සහ පරත්වාරෝපනය ලෙස පවත්නා නොදැනුවත්කම විවිධ අහේතුක විශ්වාස සහ හැසිරීම් මාලාවක් ලෙස ප්‍රකාශනයක් අත් කර ගනී. කෙසේ වෙතත්, මිනිසුන් මිථ්‍යාවේ මෙම කෝෂයෙන් මිදී එලියට පැන ගත් කල්හි, ඉහත කී විකෘත ආකාරයකට හැසිරීම නවත්වා දමනු ඇත. පොයිටියර්ගේ "ජාත්‍යන්තර ගීයේ" අධ්‍යාසය මෙයයි.
>
> "නැගිටිව් කම්කරුවනි නින්දෙන් -
> දරිද්‍රතා හිර බන්ධනයෙන්
> නිමි තර්ජන ගර්ජන හිංසා - ප්‍රබල
> යුක්තිය කැරලි ගසයි
> බිඳැරා තිමිර ජාලා - අවිදූ වහල්ලුනේ
> නැගෙව්
> පෙරලා පැරනි ලෝකේ මෙ දෙරනත
> කරලවු
> හෙලි පෙහෙලි
> උර දී නැගී එවු සෝයුරන් සංග්‍රාමයට
> අවසන්
> ජාත්‍යන්තරේ කරයි මනුවග එක්සත්
> එක්සිත්
> නෙක ගොවියන් පීඩිත අසරනයින් -
> උරදී මැද කම්කරු සේනා
> උරුමේ ගනිවු ධරනිතලේ - පලවාහැර
> ප්‍රචන්ඩතා
> බිඳැරා තිමිර ජාලා - අවිදූ වහල්ලුනේ
> නැගෙව්
> පෙරලා පැරනි ලෝකේ මෙ දෙරනත
> කරලවු
> හෙලි පෙහෙලි
> උර දී නැගී එවු සෝයුරන් සංග්‍රාමයට
> අවසන්
> ජාත්‍යන්තරේ කරයි මනුවග එක්සත්
> එක්සිත්
> රුහිරු උරා බී තරවූ ධන රකුසු යුගය
> සිඳලවු
> සැම දීනකම් කර භංගා නව යුගය
> ගෙනෙයි අරුනෝදේ
> බිඳැරා තිමිර ජාලා - අවිදූ වහල්ලුනේ
> නැගෙව්
> පෙරලා පැරනි ලෝකේ මෙ දෙරනත
> කරලවු හෙලි පෙහෙලි
> උර දී නැගී එවු සෝයුරන් සංග්‍රාමයට
> අවසන්
> ජාත්‍යන්තරේ කරයි මනුවග එක්සත්
> එක්සිත්.''

"මෙවන් දර්ශනයක් ඥානය දරන්නන් වරප්‍රසාදිතයන් බවට පත්කිරීමට යොමු වේඃ ප්ලේටෝගේ ගුහාවේ අඳුරු සෙවනැලි ලෝකයෙන් එලියට පැනගත්තෝ ම ය සත්‍යයේ ආලෝකය දැකගත්තෝ. දෙවන ජාත්‍යන්තරයේ මාක්ස්වාදය මෙම වර්ගයේ හේතුවාදයේ සැලකිය යුතු ප්‍රමානයක් දරා සිටියෝය; එය විද්‍යාව පිලිබඳ මනෝ ග්‍රස්තියට පෝර දැමීමට ආධාර විය. ගැටලුවේ ම කොටසක් ද හේතුවේ කොටසක් ද වූයේ මාක්ස් සහ එංගල්ස් *මනෝවිද්‍යාවක් වර්ධනය කර ගැනීමට අසමත්වීම ය. ඔව්හු මානව ප්‍රේරනයේ සංකීර්නතාවයන් පිලිබඳව ඉතුරු කර තැබුවේ ඉතා හීන දායාදයකි; ඔවුන්ගේ*

*සමීපතම අනුප්‍රාප්තිකයන්ගෙන් වැඩිදෙනා මෙම අඩුව ජයගැනීම සඳහා එතරම් උනන්දුවක් නො දැක්වූහ. පුද්ගලයා පිලිබඳ සරල සංකල්පයක් සරල සමාජ මූලෝපායයන් සමග එකට පැවැතුනි."* (ලන්ඩන් සහ නිව්යෝක් 1987. 67-68 පිටු. මෙහි අවධාරිත වචන පෙන්නුම් කරන්නේ ගත වූ (2005) අගෝස්තුවේ මගේ දේශනයේ දී මා සෘජුව උපුටා දැක් වූ කොටස ය.)

මෙම සම්පූර්න ඡේදය ම කුමන ආකාරයකින් හෝ ජියොසෙගාන්ගේ තර්කය පිලිබඳ මගේ සාරාංශයට විරුද්ධ වන්නේ නැත. මා එම කතුවරයා සාවද්‍ය ලෙස උපුටා දක්වා ඇතැ යි චෝදනා කරනවා වෙනුවට ඔබ විසින් කල යුතුව ඇත්තේ ඔබ ඔහුගේ අදහස් සමග එකඟවීමට එලඹී සිටින්නේ කුමන මාවතින් දැයි පැහැදිලි කිරීම ය. බුද්ධි ප්‍රබෝධය කෙරේ ඔබ දක්වන්නා වූ දෙපිටකාට්ටුබව මා දැනට ම සටහන් කර තබා ඇත. ඉහතින් මා උපුටා දැක් වූ ඡේදය මවිසින් "බුද්ධි ප්‍රබෝධය අවිචාරාත්මකව ආරක්ෂා කිරීම" ගැන ඔබ කලින් ම දක්වන්නා වූ විරුද්ධත්වයේ උත්පත්තිය හෙලිකරනවා පමනක් නො වේ, ඔබ විසින් නව යුතෝපියානුවාදය වැලඳ ගැනීම ඔබව අතිශයින් ම රෝගී දෘෂ්ටිවාදාත්මක හා දේශපාලන සංගමයක් තුල පිහිටුවා ඇති බව ද පැහැදිලි කරයි.[26]

## 19. ඩැනියෙල් ගුඒරින් සැබැවින් ම ලියා තැබුවේ කුමක් ද?

ජාත්‍යන්තර කමිටුව සමාජවාදය සඳහා අරගලය උදෙසා තීරක වූ "මානුෂික සාධකයන්" ගේ වැදගත්කම වටහා ගැනීමට අසමත් යයි ද ඒවා නො තකා හරී යයි ද ඔබ යලියලිත් කියා පාන්නෙහි ය. අප දැන් කරන්නේ 1933 හිට්ලර්ගේ ජයග්‍රහනයට පෙරාතුව "ව්‍යාජ 'භෞතිකවාදයක' නාමයෙන්, මහජන සහයෝගය බලමුලු ගන්වා ගැනීම සඳහා දේශපාලන විඥානවාදය ඉටු කල භූමිකාව පිලිකුල් කල" ස්ටැලින්වාදීන් සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් එකල්හි කරන ලද වරද ම යයි ඔබ කියන්නෙහි ය. මෙම තර්කයට සහාය සඳහා ඔබ 1930 ගනන්වල සුප්‍රසිද්ධ ට්‍රොට්ස්කිවාදියෙකු වූ ඩැනියෙල් ගුඒරින්ගේ *Fascism and Big Business* (ෆැසිස්ට්වාදය සහ මහා ජාවාරම්) නම් කෘතිය ගැන සඳහන් කරන්නෙහි ය. ඔබ පිටු 318කින් යුත් මෙම කෘතියේ හරියට ම එක ම එක ඡේදයක් මෙසේ උපුටා දක්වන්නෙහි යඃ "පරිහානියට පාත්‍ර වූ මාක්ස්වාදියෝ මානුෂික සාධක කෙරේ පිලිකුලක් දැක්වීම ඉතා " මාක්ස්වාදී ය" යි ද "භෞතිකවාදීය" යි ද විශ්වාස කරති. ඔව්හු ගනන්හිලව්, සංඛ්‍යාලේඛනයන් සහ ප්‍රතිශතයන් ගොඩගසා ගනිති; සමාජ ප්‍රපංචයන්ගේ ප්‍රගාඪ හේතු සාධක ඉතා නිවැරදිව අධ්‍යයනය කරති. එහෙත් එම සුපරීක්ෂ බවින් ම *මිනිසුන්ගේ විඥානය* තුල හේතු සාධක *පිලිබිඹු වන්නේ* කුමන ආකාරයකින් දැයි අධ්‍යයනය කිරීම ප්‍රතික්ෂේප කොට මිනිසාගේ ආත්මය විනිවිද යාමට අසමත් වීම මගින් ඔව්හු මෙම ප්‍රපංචයන්ගේ *ජීවමාන යථාර්ථය* අහිමි කර ගනිති."

මෙම ඡේදය ගැන ඔබ කරන අටුවාවේ දී ඔබ මෙසේ කියා සිටී. ''රීක් සහ ෆ්‍රොම් තිස් ගනන්වල දී කියා සිටියේ ද රාක්ෂස යයි නෝර්ත් ට හැඟී ගිය ප්‍රකාශයක දී ජියොසෙගාන් යලිත් කීවේ ද  හරියට ම මෙන්න මේ දෙයයි." මේ අනුව ඔබේ පාඨකයා ලවා ගැන්වීමට ඔබ බලාපොරොත්තුවන නිගමනය වන්නේ විද්‍යාව සහ වෛෂයික තත්වය පිලිබඳ භෞතිකවාදී අර්ථකථනය පමන ඉක්මවා අවධාරනය කිරීම සහ මාක්ස්වාදීන් අතර මනෝවිද්‍යාත්මක වැටැහීමක් නො තිබීම නාසි ජයග්‍රහනයට වැදගත් ප්‍රතිපාදනයක් කල බව ගුඒරින්ගේ විශ්වාසය වූ බවයි. ගුඒරින් 1930 ගනන්වල සුප්‍රසිද්ධ ට්‍රොට්ස්කිවාදියෙකු වූ නිසා, මෙය ලියොන් ට්‍රොට්ස්කිගේ දෘෂ්ටිය ද වී යයි ඔබේ පාඨකයන්ට ඒත්තු ගැන්වීම ද ඔබට අවශ්‍ය වී තිබේ.

ඔබ මෙම උද්ධෘතය ද ඉදිරිපත් කර ඇත්තේ නොමග යන හා වංචනික ආකාරයකට ය. ඔබේ මතයන්ට - මේවා ගුඒරින්ගේ මතයන්ට වඩා බෙහෙවින් වෙනස් බැව් අපි ඉදිරියේ දී පෙන්වා දෙමු - සහය පිනිස වාක්‍ය තුනක් උපුටා දක්වා ඇත. ඔහු (ගුඒරින්) ලියන මේ "පිරිහුනු මාක්ස්වාදියෝ" කවරහු ද? ගුඒරින්ගේ හෙලාදැක්මට පාත්‍රවන "ව්‍යාජ භෞතිකවාදය" කුමක් ද?

මෙම ලේඛනය තුල කිහිපවිටක් ම අප විසින් අනුගමනය කෙරුනු ක්‍රියා පිලිවෙල අපි යලිත් අනුයන්නෙමු.  අපි කතුවරයාගේ සැබෑ පාඨය කරා ගොස් ඔබේ උද්ධෘතය උචිත සන්දර්භය තුල තබන්නෙමු. ඔබ උපුටා ගත් පරිච්ඡේදය "ෆැසිස්ට්වාදී ගූඪවාදය" යන මැය දරයි. එය මහජනතාව නොමග යැවීමට ද රැවටීමට ද ෆැසිස්ට්වාදීන් යොදාගත් ප්‍රචාරක හා උද්ඝෝෂන තාක්ෂනයන් පිලිබඳ අගනා විස්තරයක් ඉදිරිපත් කරයි. මෙහි දී ගුඒරින් ෆැසිස්ට්වාදීන් තමන්ට දිනාගැනීමට අපේක්ෂා කල අනුගාමිකයන්ගේ හැඟීම් සහ අන්ධ භක්තියට කල ඇමතීම් ඔවුන් සේවය කල පන්ති අවශ්‍යතා විසින් නීර්නය කරනු ලැබූ බව පෙන්වා දෙයි.  "දේපල හිමි පන්තීන්ගේ මුදල් ආධාර මත යැපුනු පක්ෂයක් දේපල හිමියන්ගේ වරප්‍රසාද ආරක්ෂා කිරීමේ රහසිගත අරමුන සහිත වූ පක්ෂයක් තමන්ට බඳවාගැනීමට අපේක්ෂා කරන අයගේ බුද්ධියට ආමන්ත්‍රනය කරන්නේ නැත. ඒ වෙනුවට මහජනයා තමන්ට මුලුමනින් වශී වී ඇතැයි තමන්ට ඒත්තුයන තෙක්, ඔවුන්ගේ බුද්ධියට ආමන්ත්‍රනය කිරීම එතරම් සුබ නො වෙතැයි එවන් පක්ෂයක් කල්පනා කරයි." (ෆැසිස්ට්වාදය සහ මහ ජාවාරම්. (නිව්යෝක්, 1973- 63 පිටුව)

අන්ධ භක්තියට ෆැසිස්ට්වාදීන්ගේ ආමන්ත්‍රනය ෆැසිස්ට්වාදය "තම ආමන්ත්‍රනය කාලකන්නි හා අතෘප්තිමත් කොටසට එල්ල කිරීමට තරම් වාසනාවන්ත වීම" නිසා පහසුව ඇතැ යි පැහැදිලි කිරීමට ගුඒරින් ඉදිරියට යයි. ඔහු මෙසේ නිරීක්ෂනය කරයි, "දුක් විඳීම ගූඪවාදයට යොමු කරන්නේ ය යන්න ලෝකය තරම්

මැ ඉපැරනි ප්‍රපංචයකි. මිනිසා දුක් විඳින විට තර්ක බුද්ධිය හැර දමයි. තමාගේ දුකට තර්කානුකූල ප්‍රතිකර්ම ඉල්ලා සිටීම නවත්වයි; ගැලැවී ගැනීමට අවශ්‍ය ධෛර්යයට අභිමි වෙයි. හාස්කමක් අපේක්ෂා කරන ඔහු ගැලැවුම්කරුවෙක් ඉල්ලා සිටී. ඔහු එවැන්නෙකු අනුයෑමට ද එවැන්නකු උදෙසා ජීවිතය වුව ද පිදීමට ද සූදානම් ය.

"අන්තිමේ දී ෆැසිස්ට්වාදය විසින් - අප එසේ කීම නිවැරදි නම් - මහජනතාව පිලිකුලෙන් සලකනු ලබන නිසා ම එය සමාජවාදය පරයා ආධිපත්‍යය අත් කර ගනී. එය, ඔවුන්ගේ (මහජනතාව) ම දුබලතාවය තුලින් ඔවුන් ජය ගැනීමට කිසිසේත් නො පැකිලෙයි." (එම 63-64 පිටු)

ඔබ ඔය තරම් උනුසුමෙන් අගය කරන කෘතීන්ගේ කර්තෘ වන ජියොසෙගාන්ගේ අදහස්වලට ගුඑරින්ගේ අදහස් කෙතරම් අතිමූලික අන්දමකින් ප්‍රතිවිරුද්ධ දැයි වහාම වටහා ගැනීමට ඉහත සඳහන් ඡේදය පමනක් වුව කියවීම සෑහේ.

ෆැසිස්ට් ආරාධනයේ තර්ක-බුද්ධි විරෝධය ගුඑරින් විසින් සලකනු ලබන්නේ ප්‍රතිගාමී අරමුනුවල ප්‍රකාශනයක් ලෙස ය. අනුකරනය කිරීම පසෙක තිබියේවා අඩු ගනනේ යමක් උගෙන ගැනීම පවා කල හැකි මනෝ ආකෘතියක් ලෙස හෝ ඔහු එය සලකන්නේ නැත.

පිටු කිහිපයකට පසුව ෆැසිස්ට්වාදීන්ගේ ප්‍රචාරය හා ජන බලමුලුගැන්වීම් තාක්ෂනය පිලිබඳ සිය විශ්ලේෂනයේ අවසන ගුඑරින් තීරක ප්‍රශ්නය මතු කරයිඃ *"ෆැසිස්ට් 'ගුඪවාදය' පැරදවීමට කම්කරු ව්‍යාපාරය කර ඇත්තේ කුමක් ද?"* කම්කරු ව්‍යාපාරය මෙම කර්තව්‍යය සඳහා සඵල විධීන් වර්ධනය කිරීමට අසමත්වීම ගැන ගුඑරින් ඉදිරිපත් කරන හේතු ජියොසෙගාන් විසින් ඉදිරිපත් කරනු ලබන ආස්ථානයට මොන ම සාම්‍යයක් වත් දරන්නේ නැත. සියල්ලට ප්‍රථමයෙන් ගුඑරින් ජනතා උද්ඝෝෂන ක්ෂේත්‍රයේ දී සමාජවාදීන් මුහුන දෙන්නා වූ සමහර ගැටලු ගලා එන්නේ සමාජවාදයේ 'ස්වභාවයෙන්'ම බව පෙන්වා දෙයි. "සමාජවාදය වනාහි විද්‍යාත්මක සංකල්පනයක් මිස ආගමක් නො වේය" යි ගුඑරින් කරුනු පැහැදිලි කරයි. එහෙයින් එය හැඟීම්වලට හා පරිකල්පනයට වඩා බුද්ධියට හා තර්ක ඥානයට ආමන්ත්‍රනය කරයි. සමාජවාදය සාකච්ඡාවකින් තොර ව පිලිගත යුතු වූ ඇදැහිල්ලක් පටවන්නේ නැත; එය ධනේශ්වර පද්ධතිය පිලිබඳ හේතුවාදී විචාරයක් ඉදිරිපත් කර ව්‍යාපාරයට බැඳීමට පෙර සෑම කෙනෙකුම පෞද්ගලිකව ම බුද්ධිමය හා නිගමනාත්මක තර්ක විචාරයක් හා නිගමනයක් කරා එලඹී ගත යුතුව ඇතැ යි අපේක්ෂා කරයි. එය ඇහැට හෝ ස්නායුවලට වඩා මොලයට ආමන්ත්‍රනය කරයි. එය උත්සාහ කරන්නේ පාඨකයා හෝ ශ්‍රාවකයා සාවධානව ඒත්තු ගැන්වීමට ය, ඔහුව අල්ලා ගැනීමට නො වේ, ඔහුගේ හැඟීම් අවුස්සා වශී කිරීමට නො වේ." (එම 73 පිටුව)

සමාජවාදයේ ප්‍රචාරක තාක්ෂනය "පුනර්ජීවනය කොට නවීකරනය කල යුතුය" යි. පිලිගන්නා ගුඑරින්, එසේ කල යුතුව ඇත්තේ, "එයට ලං වීමට මහ ජනතාවට වඩාත් ඉඩ සැලසෙන පරිදි ය; ඔවුන්ට තේරෙන පැහැදිලි හා සෘජු භාෂාවෙන් කතා කිරීමට ය" යි කියා සිටී. එහෙත් මෙම යෝජනාව සමග ම ඔහු සමාජවාදයට "*තමන්ව ම පාවා දී ගැනීමේ අනතුරට මුහුන නොපා, ෆැසිස්ට්වාදයේ පරිද්දෙන් රංචුවල පහත් හැඟීම් ඇමතීමට නොහැකි ය*"යි අවධාරනය කරයි. "ෆැසිස්ට්වාදය මෙන් එය (සමාජවාදය) මහජනතාව *පිලිකුලෙන් තකන්නේ නැත*, ගෞරවයෙන් සැලකිල්ලට ගනී. දැන් පවත්නා තත්වයට වඩා උසස් තත්වයකට ඔවුන් නංවා ගැනීම එයට අවශ්‍ය ය; එයට (සමාජවාදයට) අවශ්‍යවන්නේ සමාජවාදය ගලා එන සවිඥානක කම්කරු පන්තියේ ප්‍රතිරූපය ලෙස මහජනතාව පිහිටා ගැනීම ය. එය යත්න දරන්නේ, ඔවුන්ගේ බුද්ධිමය මට්ටම හා වීර්යය ඔසොවා ලීමට මිස පහත දැමීමට නො වේ." (එම.73-74 පිටු. මුල්කෘතියේ අවධාරනය.)

ස්ටයිනර් හා බ්‍රෙනර් සහෝදරවරුනි, ඔබ මේ මහාර්ඝ සුන්දර වදන් ගෙන හැර නොදක්වීමට තරම් නිර්ලජ්ජිත වූයේ එම වදන් තර්ක බුද්ධියේ බලය පිලිබඳ මාක්ස්වාදී විශ්වාසය ආරක්ෂා කිරීම් වස් බෙනෙන බව ද සමාජවාදයේ විජයග්‍රහනය සඳහා අවශ්‍ය වන්නේ සවිඥානකතාවය ඔසොවාලීම මිස උපවිඥානය මනෝවිද්‍යාත්මකව කැලැම්බීම නොවේ ය යන අදහස දරා සිටුනා බව ද ඔබට ඉතා හොඳින් වැටැහෙන හෙයිනි. අප විසින් අමතක නොකටයුතු වූ ම අරමුනක්, එනම් ෆැසිස්ට්වාදය සහ පාලක ප්‍රභූව අතර වෛෂයික දේශපාලන සම්බන්ධතාවන් එලිදරව් කිරීම (එනම් ෆැසිස්ට්වාදය නමැති දේශපාලන ප්‍රපංචයන් පිලිබඳ විද්‍යාත්මක අභිනිවේශයක් සම්පාදනය කිරීම) තම කේන්ද්‍රීය අරමුන බවට පත් කරගත් ගුඑරින්ගේ කෘතියේ කොතැනක හෝ, මාක්ස්වාදයේ ගැටලුව වන්නේ " විද්‍යාව පිලිබඳ ග්‍රස්තියක් ය" යනා'කාර මොන ම ඇඟවීමක් වත් ඇත්තේ නැත.

එසේනම් ෆැසිස්ට්වාදයේ උද්ඝෝෂනයට සාර්ථකව මුහුන දීමට සමාජවාදය අසමත් වූයේ මන්ද? සමාජවාදී ව්‍යාපාරය "පිරිහී ගියේ" කුමන ආකාරයකට ද? ගුඑරින්ගේ පිලිතුර වන්නේ සමාජවාදී ව්‍යාපාරය දේශපාලනිකව අවස්ථාවාදී වූ බව ය. "එය අරගලයකින් හා කැප කිරීමකින් තොරව, 'මිහිපිට සුරලොවට' අමතරව ක්ෂනික වාසි ද ග්‍රාම්‍ය භාවිතයක් වූ 'පන්ති සහයෝගිතාවය' මගින් අත් පත් කර ගත හැකි යයි විශ්වාස කිරීමට පටන් ගත්තේ ය." (එම 74 පි.) "තත්වාරක්ෂකවාදී සහ රටාගත මනසින් යුත්, පවත්නා පර්යාය තුල මුල් බැසගත්, කා බී තරව උදාසීන වූ, "මහජනයාගේ නිවෙස්" යයි නම් දෙන මහ මන්දිරවල කම්කරුවන්ගේ පැන්සවලින් ගෙවුම් කමින්

බලය පවත්වන මහ නායක පැවිද්දන් යයි ගුජ්රින් ඔවුන් ගැන පරිහව කරයි. මන්ත්‍රීමන්ඩල අසුනක්, වෘත්තීය සමිති කාර්යාලයක සැප පුටුවක් දිනා ගැනීම මෙම පිරිහුනු සමාජවාදයේ නායකයින්ගේ ජීවනාභිලාෂය විය. තව දුරටත් විශ්වාසයේ නොව විනෝදයේ යෙදුනු ඔවුහු තමන්ට ම ගැලපෙන, පරමාර්ථ නැති, භෞතික අතමිට වාසිවලට ආකර්ශනය වූ අනුගාමිකත්වයක් ප්‍රාර්ථනය කලහ." (එම 75 පි.)

ගුජ්රින් සඳහන් කරන පරිහානියේ මුල් පැවතුනේ මාක්ස්වාදයේ අසාර්ථකත්වය හා අඩුලුහුඬුකම් තුල නො වේ. කම්කරු නිලධරයේ අවස්ථාවාදය තුල ය. ඉක්බිති, ඔබ ඉදිරිපත් කරන ඡේදයට ක්ෂනිකව ඉහතින් එන ඡේදයේ ගුජ්රින් පැහැදිලි කරන්නේ අවස්ථාවාදය විසින් මාක්ස්වාදී විධික්‍රමය අවකැනූ (වලකැපූ) සැටි ය.

"ඒ සමග ම එහි න්‍යාය ධර්ම ක්ෂේත්‍රයේ දී සමාජවාදය එහි සාරභූත සංකල්පයන්ගෙන් එකක් 'ඓතිහාසික භෞතිකවාදය' විකෘති කලේ ය. ප්‍රථම මාක්ස්වාදීන්ට අනුව, "ආර්ථික ජීවිතය නිෂ්පාදනයේ මාධ්‍යයන් සමාජ, දේශපාලන හා බුද්ධිමය ජීවිතයේ සන්තතීන් පොදුවේ හැඩ ගස්සන්නේ ය" යන අර්ථයෙන් ඔව්හු භෞතිකවාදීන් වූහ. ඉතිහාසයේ ප්‍රගාඪතම ප්‍රේරක බලය මානව වර්ගයා තමන් තුල ම දරා සිටින්නා වූ ද අනුක්‍රමයෙන් ශතවර්ෂයන් හරහා මානව වර්ගයා විසින් සාක්ෂාත් කර ගනු ලබන්නා වූද දැනටම පවත්නා හිමිකම හා යුක්තිය පිලිබඳ අදහසක් යයි සලකන "විඥානවාදීන්" සේ නො ව, ඒ මුල්කාලීන "සමාජවාදියෝ" නිෂ්පාදන සම්බන්ධතා, මිනිසුන් එකිනෙකා අතර ආර්ථික සම්බන්ධතා, ඉතිහාසයේ අධිපති ක්‍රියාකලාපයක් ඉටු කරන බව විශ්වාස කලහ. ඔව්හු, තමන්ට පෙර නො තකා හැර තිබුනු ආර්ථික පදනම අවධාරනය කලෝ නම්, ඒ අතර ම කවර අන්දමකින් හෝ අධිකරනමය, දේශපාලන, ආගමික, කලාත්මක සහ දාර්ශනික 'උපරිව්‍යුහය' කවර අන්දමකින් හෝ නොතකා නො හැරියෝ ය. එය පදනම විසින් සාධනය කරනු ලැබූ බව ඔව්හු විශ්වාස කලහ; එහෙත් උපරිව්‍යුහය ද නො අඩුව ම එයට අයත් වූ අගය දරා සිටිමින් ඉතිහාසයේ ඒකාග්‍ර කොටසක් වී ය." (එම 75 පිටුව මුල් කෘතියේ අවධාරනය).

අවසන, එහි උචිත සන්දර්භය තුල, ඉතිහාසය පිලිබඳ මාක්ස්වාදී භෞතිකවාදී සංකල්පනය ආරක්ෂා කොට යලි ප්‍රකාශ කිරීමක් අනුයමින් අප එන්නේ ඔබ ඉහතින් උපුටා දැක් වූ ඡේදයට ය. පැහැදිලිකම තකා අපි එය යලිත් උපුටා දක්වමු.

"පරිහානියට පාත්‍ර වූ මාක්ස්වාදියෝ මානුෂික සාධක කෙරේ පිලිකුලක් දැක්වීම ඉතා "මාක්ස්වාදී ය" යි ද "භෞතිකවාදීය" යි ද විශ්වාස කරති. ඔව්හු ගනන්හිලව්, සංඛ්‍යාලේඛනයන් සහ ප්‍රතිශතයන් ගොඩගසා ගනිති; සමාජ ප්‍රපංචයන්ගේ ප්‍රගාඪ හේතු සාධක ඉතා නිවැරදිව අධ්‍යයනය කරති. එහෙත් එම සුපරීක්ෂ බවින් ම මිනිසුන්ගේ *විඥානය තුල හේතු සාධක පිලිබිඹු වන්නේ කුමන ආකාරයකින් දැයි* අධ්‍යයනය කිරීම ප්‍රතික්ෂේප කොට මිනිසාගේ ආත්මය විනිවිද යාමට අසමත් වීම මගින් ඔව්හු මෙම ප්‍රපංචයන්ගේ *ජීවමාන යථාර්ථය* අහිමි කර ගනිති."

ගුජ්රින් අවධාරනය කරන කරුන දැන් අපට හොඳින් වටහා ගත හැකි ය. පරිහානිගත නිලධරය තමන්ගේ ම අවස්ථාවාදයට ඔබින පරිදි මාක්ස්වාදයේ ග්‍රාම්‍ය හා යාන්ත්‍රික කාටූන් චිත්‍රයක් භාවිතයට නැංවී ය. ඔව්හු, ධනේශ්වර සමාජය මුහුන දී සිටි ප්‍රගාමීව වියරු බවින් වැඩි වන්නා වූ තත්වය අත්පත් කර ගන්නා අසංඛ්‍ය රූපාකාරයන් වටහා ගැනීමට අසමත් වූහ. වයිමාර් ප්‍රජාතන්ත්‍රයේ මස් හැලි කර බැඳගත්, දූෂිත සමාජවාදී ව්‍යාපාරයට මහජනතාවට ආමන්ත්‍රනය කිරීමේ මාවතක් සොයාගත නොහැකි විය. ගැටලුව පැවැත්තේ මාක්ස්වාදයේ නො වේ, ඓතිහාසික භෞතිකවාදයේ නො වේ. ගැටලුව පැවැත්තේ මාක්ස්වාදයේ විප්ලවවාදී ඉදිරි දර්ශනය ද අරගලයට පවත්නා කැපවීම ද අවස්ථාවාදීව අත්හැර දැමීම තුල ය.

ගුජ්රින් තමාගේ විශ්ලේෂනය හමාර කරන්නේ මෙසේ අනතුරු හඟවමිනි. "තමන් කැපවී ගැනීමට දැවෙන ආශාවෙන් යුක්තව සිටින්නා වූ මිනිසුන් ගැහැනුන් හා තරුනයන් දහස් ගනන්, ආකර්ෂනය කර ගැනීමට අතිශයින් ම අවස්ථාවාදී වූ පාර්ලිමේන්තුවාදය හෝ ග්‍රාම්‍ය වෘත්තීය සමිතිවාදය කවර කලෙක වත් සමත් වනු නැත. සමාජවාදය තම ආකර්ෂන බලය යලි දිනා ගැනීමට සමත් වන්නේ එහි උත්තරීතර අරමුන වූ "මිහිපිට දෙව්ලොව" දිනා ගැනීම සඳහා යෝධ අරගල හා කැප කිරීම් කරන්නට සිදු වන බව ජනතාවට ප්‍රකාශ කිරීම මගිනි."

ගුජ්රින්ගේ කෘතිය පිලිබඳ අප සමාලෝචනය නිෂ්ටාවකට ගෙන ඒමේ දී, 1965 එහි ප්‍රන්ස මුද්‍රනයට ලියන ලද සිය ප්‍රස්තාවනාවේ දී කතුවරයා "ජර්මනිය සහ ප්‍රන්සය පිලිබඳ ලියොන් ට්‍රොට්ස්කිගේ ලේඛන මග පෙන්වන්නක් ලෙස ආධාර වී යයි" පිලිගත් බව සඳහන් කල යුතුය. "ධනපති පන්තිය සහ කම්කරු පන්තිය අතර වැනුනු, එක් අතකට ආර්ථික අර්බුදය විසින් ද අනෙක් අතට කම්කරු පන්තියේ වගකීම් මගහැරීම මගින් ද අන්ත දකුනේ මැරවරයන් දෙසට තල්ලු කරනු ලැබූ, මධ්‍යම පන්තීන් පිලිබඳ සංකීර්න ප්‍රශ්න වටහා ගැනීමට ඒවා මට ආධාර වූහ." (එම, 17 පිට)

## මතු සම්බන්ධයි

## සටහන්

23. ඔබ හෙගේලියානු වාක්‍යවේදය යොදා ගන්නා ආකාරය තනිකර ම විතන්ඩවාදී ය. යුතෝපියානුවාදය සහ මාක්ස්වාදය අතර සම්බන්ධතාවය පිලිබඳව සැබෑ පැහැදිලි කිරීමක් කරනවා වෙනුවට, ඔබ කරන්නේ ඕෆ්හෙබන් (සමතික්‍රමනය) සහ 'ප්‍රතිපක්ෂයන්ගේ එකමුතුව' යනාදී පද යොදාගැනීම යි. මේ වනාහි කිසිම දෙයක් නොකියා ප්‍රගාඪ භාවයක්

ඇගැවීම සඳහා යොදාගත් උපායකට වැඩි දෙයක් නොවේ. මෙවන් ව්‍යාජ අපෝහක-භෞතිකවාදී වාක්‍ය සාවද්‍ය ලෙස පරිහරනය කිරීම පිලිබඳ උදාහරන ඔබ මාක්ස්ගේ "ගොතා ක්‍රියාමාර්ගය පිලිබඳ විචාරය" (ක්‍රිටික් ඔෆ් ද ගොතා ප්‍රොග්‍රෑම්) සහ ලෙනින්ගේ රාජ්‍යය සහ විප්ලවය (ස්ටේට් ඇන්ඩ් රෙවලූෂන්) ආවහනය කර ඇති ආකාරයෙන් පෙනී යයි. මෙම කෘතීන් යුතෝපියානු වාදය සහ මාක්ස්වාදය වනාහි " ප්‍රතිපක්ෂයන්ගේ" එකමුතුවක් බව පෙන්නුම් කරන වගක් පෙන්නුම් කරන්නේ යයි ඔබ කියන්නෙහි ය. මෙහි අර්ථය කුමක් ද? මෙම කෘතීන් දෙකෙන් එකක් හෝ තුල යුතෝපියානු වූ කිසිවක් ඇත්තේ නැත. (ෆුරියර් හා පෘදොංගේ ලේඛන සම්ප්‍රදාය යොදාගත් සමහර භාෂා ප්‍රයෝගයන් කිහිපයක් හැරෙන්නට මේවායේ යුතෝපියානු ලක්ෂන කිසිවක් ඇත්තේ නැත. *The Right to be Lazy* (උදාසීන වීමේ අයිතිය) පිලිබඳ ලෆාග්ගේ කෘතිය ගැන කිව හොත් එය ඇත්තට ම ඉතා සුලුපහේ කෘතියකි.)

---

ගොතා ක්‍රියාමාර්ගය පිලිබඳ මාක්ස්ගේ විචාරය ලියන ලද්දේ ලසාල්වාදීන්ගේ සංකල්පයන්හි ගති ලක්ෂන වූ සුලුධනේශ්වර සාරසංග්‍රහවාදය සහ මනෝරාජකවාදයේ සියලු මතිමාත්‍රයන් ද ඔහුගේ ම විද්‍යාත්මක සංකල්පයන් ද අතර පැහැදිලි බෙදුම්කඩනයක් සලකුනු කර ගැනීමේ පැහැදිලි අරමුන ඇතිව ය. උදාහරනයක් හැටියට මාක්ස් "ශ්‍රමයේ ඵලයන්","සාධාරනව බෙදාහැරීම" පිලිබඳ ලසාල්ගේ සපථය දුවෙනසුලු විවේචනයකට භාජන කලේ ය; "හිමිකමට කවර කලෙක වත් සමාජයේ ආර්ථික ව්‍යුහයෙන් ද එය (එම ආර්ථික ව්‍යුහය) විසින් නිර්නය කරනු ලැබ ඇති සංස්කෘතික වර්ධනයෙන් ද ඉහලට නැග ගත නොහැකි යයි ද මාක්ස් පෙන්වා දුන්නේ ය. අවිනිශ්චිත හෝ /සහ සාවද්‍ය සූත්‍රකරනයන් කෙරේ තම දරුනු ආකල්පය යුක්තිසහගත කිරීමේ දී මාක්ස් මෙසේ ලිවී ය, "එක්තරා කාල පරිච්ඡේදයක දී කිසියම් අර්ථයක් පැවතියා වූ ද දැන් යල් පැන ගිය වාචික කුනු කන්දල් බවට පත්වී ඇත්තා වූද අදහස් අප පක්ෂය මත පැටවීමට සහ, ඒ සමග ම දැඩි පරිශ්‍රමයක් තුලින් පක්ෂය තුලට කාවද්දා ඇත්තා වූ ද, දැන් පක්ෂය තුල මුල් බැස ගෙන ඇත්තා වූ ද යථාර්ථවාදී දෘෂ්ටි ආස්ථානය අවමංගත කිරීමට ද ප්‍රන්ස ප්‍රජාතන්ත්‍රවාදීන් හා සමාජවාදීන් අතර පැතිර ගිය මතවාදී, නීතිමය සහ වෙනත් රොඩුබොරොඩු යොදාගැනීමට දරනු ලබන ප්‍රයත්නය කොතරම් අපරාධයක් දැයි පෙන්නුම් කිරීම" අවශ්‍යව පවතී.

---

ලෙනින්ගේ *රජය හා විප්ලවය* - මාක්ස් සහ එංගල්ස් මෙම විෂය පිලිබඳව ලියූ ලිපි පිලිබඳ පරිපූර්න සමාලෝචනයක් මත පදනම් වූ රාජ්‍යය පිලිබඳ න්‍යායක් වර්ධනය කරයි. විශදව සහ ඍජුව යුතෝපියානු වාදයට එරෙහිව මාක්ස්වාදයේ විද්‍යාත්මක ආකල්පය පැහැදිලිව පිහිටුවන ලෙනින් එක් වැදගත් නිතර ගෙන හැර දක්වනු ලබන ඡේදයක මෙසේ ලිවී යඃ

---

"මාක්ස් 'නව' සමාජයක් සකස් කලේ ය. නැත හොත්, නිර්මානය කලේ ය යන අර්ථය අනුව කියතොත්, ඔහු තුල මනෝරාජිකත්වයේ සේයාවක් හෝ නොමැත. නැත, පැරනි සමාජය කෙරෙන් නව සමාජය පතිත වන සැටි සහ ස්වාභාවික ඓතිහාසික ක්‍රියාදාමයක් ලෙසට මුලින් කී සමාජයෙන් පසු කී සමාජයට පරිවර්තනය වීමේ ආකෘතිද ඔහු විසින් අධ්‍යයනය කරන ලදි...

---

"අපි මනෝරාජික නොවෙමු. සියලු පරිපාලනයත් සියලු ම යටත් කිරීමත් එක්වරම අත් හැර දැමීම ගැන අපි 'සිහින' නොදකිමු. නිර්ධන පන්තියේ කර්තව්‍යයන් නොවටහා ගැනීම පදනම් කොට ගත් මෙම අරාජිකවාදී සිහින මාක්ස්වාදයට සම්පූර්නයෙන් ම පිටස්තර ය. ඇත්ත වසයෙන් ඒවා ප්‍රයෝජනවත් වන්නේ ජනතාව වෙනස්වන තෙක් සමාජවාදී විප්ලවය කල් දැමීමට පමනකි. නැත. ජනතාව දැනට සිටින සේ සිටියදී ම අපට සමාජවාදී විප්ලවය අවශ්‍ය ය; [අවධාරනය අපේ] යටත් කිරීම, පාලනය සහ 'වැඩ මූලිකයන් හා ගිනුම් තබන්නන්' අත් හැර දැමිය නොහැකි ජනතාව සිටිය දී ම අපට විප්ලවය අවශ්‍ය ය." (ලෙනින්, *රාජ්‍යය හා විප්ලවය, තෝරා ගත් කෘති වෙලුම් දොලහ*, වෙලුම 5, මොස්කව් 1980, පි. 54-55)

---

ඔබ විසින් සමාජවාදී විප්ලවය සඳහා ජනතාව මනෝවිද්‍යාත්මකව අලුතින් සැකසීමක් අවශ්‍යව තිබේ යන ඔබගේ කියා පෑමට එරෙහි ව මෙම දෙවනු කී ඡේදය විශේෂයෙන්ම අදාල ය.

---

24. බ්ලොක් තමාගේ *The Principle of Hope* (අපේක්ෂාවේ මූලධර්මය) නම් කෘතියේ මෙසේ ලිවී ය. "සැබෑ උත්පාදනය සිදු වන්නේ ආරම්භයේ දී නොව, අවසානයේ දී ය."

---

මෙම ලිපියේ රාමුව තුල දී අර්නස්ට් බ්ලොක්ගේ නව-යුතෝපියානු න්‍යායන් පිලිබඳ පූර්න අධ්‍යයනයක් කිරීම සරලව ම නොහැකි ය. (1885-1977). ඔහුගේ චරිතාපදාන රචක වෙයින් හඩ්සන්ට අනුව බ්ලොක්ගේ චින්තනයේ වර්ධනයේ දී වැදගත්ම ආභාසයන් වූයේ ෂෝපන්හවර්, නියේෂේ, කියකග්‍රාද්, ඩොස්ටොව්ස්කි, බ්‍රෙන්ටානෝ, මෙයිනොං, වයිහිංජර්, හර්මන් කොහෙන්, රුඩොල්ෆ් ස්ටෙයිනර්, ජොර්ජ්ස් සොලේ සහ මැක්ස් වෙබර් ය. අර්නස්ට් බ්ලොක්ගේ "මාක්ස්වාදය" සමන්විත වූයේ මෙම විවිධ හා පොදුවේ ගත් කල්හි ප්‍රතිගාමී ආභාසයන්ට සාරසංග්‍රහවාදී ආකාරයකට යුදෙව්වාදී නිකායික ගුඪවාදය එකතු කිරීමෙනි. මාක්ස් සහ එංගල්ස් අර්ථශාස්ත්‍රයට දෙන ලද අවධාරනය ද ඔවුන් විසින් මාක්ස්වාදයෙන් රහසිගත ලෝකෝත්තර අංගයන් නොතකා හැරී ම ද බ්ලොක්ගේ විවේචනයට භාජන වීම පුදුමයට කරුනක් නො වේ. [*The Marxist Philosophy of Ernest Bloch* (අර්නස්ට් බ්ලොක්ගේ මාක්ස්වාදී දර්ශනය); නිව් යෝර්ක්, 1972; 33 පි.]

---

බ්ලොක්, "මාක්ස් සහ එංගල්ස් විසින් තබා යන ලද මාක්ස්වාදයට ඒක පාක්ෂික ද එහි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ බොහෝ අංගයන්ගෙන් තොර වූ බව ද විශ්වාස කල" බව හඩ්සන් කියයි. "විප්ලවවාදී අරගලය තුල සදාචාරය හා ආදරයට තැනක් දී නැත. ...මෙලොව දෙව්ලොවක් පිලිබඳ මාක්ස්වාදී සංකල්පය මීට සෑහුනේ නැත. ඒ වෙනුවට මිනිසාගේ චිර කාලීන ප්‍රාථමික ආගමික ආශාවන් සැලකිල්ලට ගනිමින් එහි අපේක්ෂාවන්ට සරිලන සූත්‍රයක් සකසා ගැනීම අවශ්‍ය විය. මාක්ස්වාදය යුතෝපියාවේ සිට විද්‍යාවට ගොස් තිබෙන දුර වැඩි ය" යි බ්ලොක් ඇඟවී ය. (එම - 33 පි.) ආගම සමග මිත්‍ර වෙමින් " මාක්ස්වාදය" වටහා ගත හැකි භාෂාවකින් මිනිසුන්ගේ තත්වය පිලිබඳව කතා කිරීම සඳහාඃ ප්‍රචාරය වර්ධනය කල යුතු ය. එම ප්‍රචාරය ඔවුන්ගේ හිස් ගෙඩි තුල පවත්නා දෘෂ්ටිවාදයට පිලිතුරු දීම ය කල යුතු; ඒ වෙනුවට ලෝකය තුල සත්‍යයට මග පාදාගැනීම සඳහා නිවැරදි න්‍යායක් විග්‍රහ කිරීමේ මිථ්‍යා මතය අත හැර දැමිය යුතු ය." (එම - 45 පි.)

---

1930 ගනන්වල බ්ලොක් ස්ටැලින්ගේ ආවේගවත් ආධාරකරුවකු විය. ස්ටැලින් ඉහල මට්ටමේ න්‍යාය ශාස්ත්‍රඥයෙකැයි බ්ලොක් ගනන් ගත්තේ ය. ඔහු මොස්කව් නඩු විභාගවලින් පටවන ලද මරනීය දන්ඩන තීන්දු උනන්දුවෙන් ආරක්ෂා කලේ ය. "යම් ප්‍රමානයකට සදාචාරාත්මක නපුර සහ 'නොවරදින සුලු ලේ ගඳ' පිලිගැනීමට තමන්ට තුබූ හැකියාව ගැන ඔහු සත්තකින් ම ආඩම්බර වීය"යි හඩ්සන් ලිවීය. ... "ස්ටැලින්වාදී සාතනවල යථාර්ථය පරමාදර්ශයට නැංවූ ඔහු එයින් පැන නැගුනු සදාචාරාත්මක උභතෝකෝටිකය මග හැර ගත්තේ,

විප්ලවවාදී බලවේගයන්ගේ මූලික යහ පරමාර්ථයන්ගේ සහ සදාචාරාත්මක වටිනාකම් සඳහා එම බලවේගයන්හි කැපවීමේ ද සන්දර්භය තුල - ඒවායේ හේතුවාදී කෙලවර නිසැක හෙයින්- සාහසිකත්වය ද, 'රක්ත භීෂනය' ද පිලිගනිමිනි." (එම- 46 පි.) පසුව ස්ටැලින්වාදී ජර්මන් ප්‍රජාතන්ත්‍ර සමූහාන්ඩුව තුල ජීවත් වෙමින් සිටිය දී වෝල්ටර් උල්බ්‍රෙච්ට්ගේ වෛරිත ආන්ඩුව විසින් 1953 මහා කම්කරු පන්ති නැගිටීම මෘග ලෙස මර්දනය කිරීමට එරෙහිව මොනම විරුද්ධත්වයක් හෝ ප්‍රකාශ කලේ නැත.

බ්‍රෙනර් සහෝදරය, ජාත්‍යන්තර කමිටුව විසින් උගෙන ගැනීමට බොහෝ දේ තිබෙනවායි ඔබ කියන මිනිහා මොහු ය. යුතෝපියාව පිලිබඳ ඔබගේ ලියවිල්ලේ මාතෘකාව සඳහා ඔබ ආවහනය කලේ මොහුගේ න්‍යායික ආදර්ශයයි!

25. මේ වන විට සියලු වෛෂයිකව සිතන පාඨකයන්ට පැහැදිලි විය යුතු කරුන නම් පසු ගිය ගිම්හානයේ මා කල දේශනය ඔබගේ මුලින් ලිපිවලට පිලිතුරක්ය යන්න ඔබ මැනවින් දූන සිටි බවය. ඔබේ වත්මන් ලියවිල්ල එම දේශන තුල දී ඔබේ අදහස්වලට එල්ල කරන ලද විවේචනවලට පිලිතුරක් යන්න ද පැහැදිලි ය.

26. ජියොසෙගාන් ආභාසය ලැබූ විවිධ මූලාශ්‍රයන් ඔබ විසින් පරීක්ෂා නො කිරීම කනගාටුවට කරුනකි. මගේ විවේචනයන්ට එරෙහිව ඔබ බලවත්සේ ආරක්ෂා කරන මෙම ..........ඡේදයේ එන සියලු ම අදහස් - මාක්ස්වාදය උවමනාවට වඩා තර්ක-බුද්ධිවාදය, කම්කරුවන් ඔවුන්ගේ පන්ති අවශ්‍යතාවයන් පිලිබඳ ඥානයක් ලබා ගත හොත් සමාජවාදය පිගනු ඇතැයි යන මාක්ස්වාදයේ පිලිගැනීම සාවද්‍ය ය. ඓතිහාසික ප්‍රේරනය පිලිබඳ සාවද්‍ය න්‍යායක් මත එය පදනම් වී ඇත. මානව මනෝ විද්‍යාව ගැන එහි දූනුම අල්ප ය. - යනාදී මේ සියලු විවේචනයන් මෙයට අවුරුදු 80 කට පෙර හෙන්ඩ්රික් ඩි මෑන් විසින් *The Psychology of Socialism* (සමාජවාදයේ මනෝවිද්‍යාව) නම් ග්‍රන්ථයේ සවිස්තරව ඉදිරිපත් කරන ලදී. 1920 ගනන්වල දී බෙල්ජියන් සමාජවාදියෙකුව සිටි ඩිමෑන් ෆ්‍රැන්ක්ෆර්ට් සරසවියේ කථිකාචාර්යවරයෙක් ව සිටියේ ය. පලමුවන ලෝක යුද්ධයෙන් ඉක්බිත්තේ ඔහු මාක්ස්වාදයෙන් බිඳී වෙන් විය. සොල්දාදුවෙක් ලෙස සේවය කරමින් තමා දූකගත් 1914-1918 මහා ජන ඝාතනය ඩි මෑන්,

"මාක්ස්වාදයේ පදනම වන ආර්ථික නියතිවාදයෙන් බිඳී තනි පුද්ගල මනුෂ්‍යයාට මානසික ප්‍රතික්‍රියාවන්ගේ විෂයය ලෙස ප්‍රමුඛත්වය දෙන දර්ශනවාදයකට මාරු වීම කරා රැගෙන ගියේ ය. (මුලින්ම 1926 දී *Zur Psychologie des Sozialismus* නමින් පල කරන ලදී. එහි ඉංග්‍රීසි පරිවර්තනය හෙන්රි ගොල්ට් සහ සමාගම විසින් පල කරන ලදී. (නිව් යෝර්ක් 1972, මෙම ඡේදය එහි 13 වන පිටුවේ පලවේ.)

මාක්ස්වාදයේ මූලික වරද වන්නේ මානව හැසිරීම තර්ක බුද්ධිමය පදනමක අර්ථකථනය කල හැකි යයි ද සමාජවාදය පැන නැංගේ කම්කරු පන්තිය තුල එහි පන්ති අවශ්‍යතාවයනට ප්‍රතික්‍රියාවක් වශයෙන් යයි ද ගැනීම බැව් ඔහු කියා සිටියේ ය.

"මාක්ස්වාදය මානුෂික ප්‍රේරනයේ බහුවිධතාවය නොතකා හරින අතර ප්‍රයුක්තීක්ගේ සංකීර්න භාවය සලකා බැලීම ප්‍රතික්ෂේප කරයි. එසේ නොවන්නට පන්ති අවශ්‍යතා සහ චින්තා ක්‍රමයන් අතර අත්‍යවශ්‍යක සම්බන්ධතාවය පිලිබඳ ඔවුන් දරන විශ්වාසය අහෝසි වනු ඇත." (එම 28 පි.)

1920 ගනන්වල දී ෆ්‍රෙඩ්රික් පොැක් සහ මැක්ස් හොල්හයිමර්ගේ නායකත්වය යටතේ ෆ්‍රැන්ක්ෆර්ට් ගුරු කුලය හැඩ ගැසෙමින් පැවති සමයේ ජර්මානු ශාස්ත්‍රාලයික කවයන් තුල *සයිකොලොජි ඔෆ් සෝෂලිසම්* නම් කෘතිය බෙහෙවින්ම බලපෑම් සහගත විය. ඩී මෑන් විසින් මාක්ස්වාදය මුලුමනින්ම ප්‍රතිරෝධනය කිරීම ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකලයේ ආරම්භකයන්ට රුචි නොවූ නමුත්, ඔහු විසින් අපෝහක භෞතිකවාදය මනෝවිද්‍යාව මගින් විස්ථාපනය කිරීමට දරන ලද ප්‍රයත්නය හොල්හයිමර්ගේ සහකරුවන් අතර වඩ වඩාත් ප්‍රකාශිත වීම දක්නට ලැබේ. ඩි මෑන් ගතහොත් ඔහු 1930 ගනන්වල දී හිට්ලර් රජයේ ආර්ථික සාර්ථකත්වයන්ගෙන් ලද

"උත්තේජනය" යටතේ *Plan du Travail* (ප්ලොං දූ ත්‍රවයි) නම් කෘතිය ලියා සෑහෙන ප්‍රසිද්ධියක් අත් කර ගත්තේ ය. ඩි මෑන්, රාජ්‍ය-පාලිත ජාතික ධනවාදය යටතේ කම්කරු පන්තිය සහ මධ්‍යම පන්තිය අතර සන්ධානයක් යෝජනා කලේ ය. නාසීන් බෙල්ජියම ආක්‍රමනය කල අවස්ථාවේ, ආන්ඩුවේ 'සමාජවාදී' ඇමතිවරයෙකුව සිටි ඩි මෑන් ෆැසිස්ට් සහකරුවෙකු බවට පත් විය. යුද්ධය අවසන ඩි මෑන් බෙල්ජියමෙන් පලා ගියේ ය. ඔහුට එරෙහිව දේශද්‍රෝහී චෝදනා මත බෙල්ජියමේ දී නඩු විභාගයක් ඔහු නැතිව ම පවත්වන ලදී. 1953 ස්විට්සර්ලන්තයේ දී ඔහු මරනයට පත් විය. ඔහුගේ ජීවිතය සමාජවාදය ඓතිහාසික භෞතිකවාදයෙන් වෙන් කිරීමට උත්සාහ කල අය පිලිබඳ, ආන්තික, එහෙත් කිසි සේත් ම ඒකායන නො වූ උදාහරනයක් විය. ඒ, වූ කලී දේශපාලනිකව භයංකර ප්‍රතිවිපාක දනවන්නා වූ ප්‍රතිගාමී ව්‍යාපෘතියකි.

© www.wsws.org